**ශීර්ෂය 228 - අධිකරණ පරිපාලන දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශිර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශය අධිකරණ පරිපාලන දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුමෙන් හා සැසඳුම් ප්‍රකාශයෙන් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 රෙගුලාසියප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයිම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරිම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවැරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරීයා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

----------------------

ශීර්ෂය 228 - අධිකරණ පරිපාලන දෙපාර්තමේන්තුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනිම, නීති,රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරිම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වු කළමනාකරණ විගණන වාර්තාව 2018 ඔක්තෝබර් 25 දින අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනිම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරිම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

---------------------

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකරණ පරිපාලනයේ සිදුකරන ලද විගණනයේදී අනාවරණය වු විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.12 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වු පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටු වී තිබුණු බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 128 ප්‍රකාර ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය** | | **ගණන්දීමේ නිලධාරී එම විධිවිධානයට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
| --- | --- | --- | --- |
| **මුදල් රෙගුලාසි** | | | |
| 128 (1)(අ) | රජය විසින් නියම කර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසාදීමෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලැකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණ භාවයෙන් යුක්තව සැලැසුම් කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට සහ/හෝ නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනීමට පරිශ්‍රමයක් දක්වා තිබීම. | 1. ක්‍රියාකාරී සැලැස්ම නිවැරදි ලෙස පිළියෙල කර නොතිබුණි. | 2.1 (අ) |
| | | 2. අයවැය ඇස්තමේන්තු තාත්ත්වික ලෙස පිළියෙල නොකිරිම | 2.7 |
| | | 3. ලේඛන හා පොත් පවත්වා නොතිබිම | 2.10 |
| | | 4. ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු | |
| 128(1)(ආ) | තම දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය හා ගිණුම්කරණය සඳහා සංවිධානය සාර්ථක බවට සහ අවශ්‍ය අවස්ථාවල දී රජයට ලැබිය යුතු ගාස්තු නිවැරදිව නිශ්චය කිරීමට ඒවා ක්‍රමානුකූලව ද, සම්පූර්ණයෙන්ම ද, අප්‍රමාදව ද එකතු කර ගැනීමට සහ ලැබෙන මුදල් ගිණුම්ගත කිරීමට ද, රජය වෙනුවෙන් වගකීම්වලට බැඳීම් සඳහා බලය දීමට ද, ඉටුකරන ලද සේවාවන් සැපයීම් අධීක්ෂණය හා පරීක්ෂා කිරීමට සහ එම රජයේ අරමුදලින් ඒ සඳහා අප්‍රමාදව හා නිවැරදිව ගෙවීම් කිරීමට ඉන් ප්‍රමාණවත් තරම් විධිවිධාන සලසා තිබීම. | 1. මානව සම්පත් කළමනාකරණයේ අඩුපාඩු. | |
| | | 2. ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම | |
| | | 3. ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන් | |

| | | |
|---|---|---|
| 128(1)(ඇ) | මුදල් රෙගුලාසි හා රජයේ වෙනත් පරිපූරක නියමයන් තම දෙපාර්තමේන්තුවේ දී පිළිපදිනු ලබන බවට හා අවශ්‍ය අවස්ථාවල දී ඒවාට අතිරේක වශයෙන් දෙපාර්තමේන්තු නියමයන් නිකුත් කරන බව. | 1. අනුකූල නොවීම්<br>2. විගණන හා කළමනාකරණ කමිටු නොපැවත්වීම<br>3. පොදු තැන්පත් ගිණුම්වල අඩුපාඩු |
| 128(1)(ඉ) | රජය සතු වූ හෝ රජයේ භාරයේ පවත්නා මුදල් බඩුබාහිර උපකරණ හා වෙනත් වත්කම් සුරක්ෂිතව තබා ගැනීම සහ සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් තරම් සහ විධිමත් විධිවිධාන යොදවනු ලබන බව, ඒවා වරින්වර සතෙයක්ෂණය කරනු ලබන බවටත්, ඒවා නිසියාකාරව නිෂ්කාශණය කරනු ලබන කල්හි එසේ නිෂ්කාශණය කිරීම නියමිත රෙගුලාසිවලට හා උපදෙස්වලට අනුකූලව කරනු ලබන බව. | 1. වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම<br>2. පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම<br>3. පාඩු හා හානි |
| 128(1)(ඊ) | හිඟව තිබෙන ගාස්තු යනාදිය අය කර ගැනීමට විශේෂ විධිවිධාන යොදන බවට සහ එම කාර්ය පැවරී ඇති නිලධාරීන් විසින් හිඟ මුදල් පිළිබඳව ඒවා අය කර ගැනීම කඩිනම් කිරීමට ගනු ලැබූ පියවර පිළිබඳව යටත් පිරිසෙන් තුන් මාසයකට වරක් හෝ අන්‍යාකාරයකින් විධානය කළ පරිදි හෝ තමා වෙත වාර්තා කරන බව. | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ සඳහන් අඩුපාඩු |

| | | |
|---|---|---|
| 128(1)(එ) | රජයේ කටයුතු ඉටු කිරීමේදී අපේක්ෂිත අරපිරිමැස්ම, කාර්යක්ෂමතාව, විධිමත්බව හා අවංකභාවය යන කරුණු පිළිබඳ නිසි සැලැකිල්ලෙන් යුක්තව තම දෙපාර්තමේන්තුවේ කටයුතු කරගෙන යන බව | 1. වාර්ෂික අයවැය සීමාව ඉක්මවා බැඳීම් වලට එළඹීම.<br>2. කළමනාකරණ අඩුපාඩු |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 2.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2017 වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මට අදාල වර්ෂයට යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර ඇතුළත් කර නොතිබුණි.

**(ආ) ගාල්ල අධිකරණ සංකීර්ණය ඉදිකිරීම**

රු.මිලියන 1,032 ක ඇස්තමේන්තුවකට මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට 2013 දෙසැම්බර් 20 දින පිරිනමා තිබුණි. ගිවිසුම් ප්‍රකාර 2013 වර්ෂයේ ආරම්භ කර 2016 වර්ෂයේ නිම වියයුතු මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු 2017 වර්ෂය තෙක්ම නිම කර නොතිබුණි.2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වර්ෂ 05 සඳහා වූ රු.මිලියන 672 ක් ප්‍රතිපාදන සලසා තිබුණි. ඉන් රු.මිලියන 375 ක වියදමක් දරා තිබුණ අතර රු.මිලියන 297 ක් උපයෝජනය කර නොතිබුණි. 2017 වර්ෂයේ භෞතික ප්‍රගතිය සියයට 47 ක් වී තිබුණි.

ව්‍යාපෘතිය ආරම්භයේදී ශක්‍යතා අධ්‍යයනයක් සිදු නොකිරීම මත භූමිය ප්‍රමාණවත් නොවීම, යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම හා අවශ්‍යතා හඳුනාගෙන ප්‍රසම්පාදන කටයුතු ආරම්භ නොකිරීම යන කරුණු මත ඉදිකිරීම් කටයුතු අතර මඟ නතර කර තිබුණි. මෙම අධිකරණ සංකීර්ණය වෙනත් ස්ථානයක ඉදිකිරීම සඳහා 2016 ජූනි 07 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි.

**(ඈ)** **නොච්චියාගම සංචාරක මහේස්ත්‍රාත් අධිකරණ ශාලාව මායිම් තාප්පය හා මායිම් වැට ඉදිකිරීම**

---

මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු රු.මිලියන 21.5 කට ඇස්තමේන්තු කර තිබූ අතර එය පෞද්ගලික ආයතනයකට රු.මිලියන 15 කට පිරිනමා තිබුණි. කොන්ත්‍රාත්කරු හා අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ලේකම්වරයා අතර 2012 ජූනි 14 දිනැති ගිවිසුම අනුව දින 371 කින් එනම්, 2013 ජූලි 02 දින කටයුතු අවසන් කළයුතු විය. ශක්‍යතා අධ්‍යයනයක් සිදු නොකිරීම, භූමි යෝග්‍යතා සහතික ලබා නොගැනීම යන කරුණු මත ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු අතරමග නතර කර තිබුණි. ව්‍යාපෘතියේ ඉදිරිවැඩ කොටස් නිම කිරීම සඳහා 2017 වර්ෂයේදී රු.මිලියන 24.5 ක් ඇස්තමේන්තු කර රු.මිලියන 4.9 ක ප්‍රතිපාදන ලබා දී තිබුණද 2017 වර්ෂය අවසානය තෙක්ම ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි.

**(ඇ)** **කළවංචිකුඩි අධිකරණයේ නව ලේඛනාගාරය හා නඩු භාණ්ඩ කාමර ගොඩනැගිල්ල ඉදිකිරීම**

---

2014 දෙසැම්බර් 22 දින ආරම්භ කළ උක්ත කොන්ත්‍රාත්තුවේ කොන්ත්‍රාත් කාලය දින 280 ක් වී තිබුණි. ඒ අනුව වැඩ අවසන් කළයුතු දිනය 2015 සැප්තැම්බර් 28 දින වුවද 2017 ජූලි 07 දින දක්වා දින දීර්ඝ කිරීම් ලබාදී තිබුණි. දින 280 ක් තුළ වැඩ අවසන් කිරීමට සැලසුම් කළ මෙම ව්‍යාපෘතිය නිම කිරීම සඳහා වසර දෙකකට ආසන්න කාලයක් ගත වී තිබුණි. මේ හේතුවෙන් අදාළ අධිකරණයේ කටයුතු පහසු කිරීමට නව ගොඩනැගිල්ල ඉදිකිරීමෙන් බලාපොරොත්තු වූ අරමුණු ඒ ආකාරයෙන්ම ඉටුවී ඇති බවක් නිරීක්ෂණය නොවීය.

**(ඉ)** **වත්තල අධිකරණ සංකීර්ණය ඉදිකිරීම - පියවර I**

---

2013 මාර්තු 01 දින වැඩ ආරම්භ කර දින 365 කින් වැඩ අවසන් කිරීම ඉලක්ක කරගෙන උක්ත ව්‍යාපෘතියෙහි මුළු පිරිවැය ඇස්තමේන්තුව රු.මිලියන 194.11 ක් වූ අතර එම කොන්ත්‍රාත්තුව රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත 2013 මාර්තු 01 දින පවරා දී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) මෙම ඉදිකිරීම් ව්‍යාපෘතිය සඳහා අවස්ථා 07 කදී දින දීර්ඝ කිරීම් ලබා දී තිබුණු අතර අවසන් දින දීර්ඝ කිරීම් අනුව වැඩ අවසන් කළයුතු දිනය 2017 අගෝස්තු 31 දින විය. විගණන දිනය වූ 2017 නොවැම්බර් 11 දින දක්වා මෙම ව්‍යාපෘතිය අවසන් වී නොතිබුණි. එසේ වැඩ අවසන් නොවීමට 2015 හා 2016 වර්ෂවල භෞතික ප්‍රගතිය දුර්වල මට්ටමක පැවතීමද හේතු වී තිබුණි.

(ii) ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශයේ ස්ථාවර තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් ඇස්තමේන්තුවේ මිල ගණන් අනුමත කරනු ලැබීමට යටත්ව, රු. මිලියන 194.11 ක මුළු පිරිවැය ඇස්තමේන්තුව මත කොන්ත්‍රාත්තුව රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත පිරිනැමීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. ඒ අනුව ස්ථාවර තාක්ෂණික ඇගයීම් කමිටුව අනුමත කළ ඇස්තමේන්තුව රු.මිලියන 156.19 ක් විය. එහෙත් විගණන දිනය වූ 2017 නොවැම්බර් 14 දින වන විට ව්‍යාපෘතිය සඳහා දරන ලද මුළු වියදම රු.මිලියන 212.78 ක් වීමෙන් ඇස්තමේන්තුව ඉක්මවා රු.මිලියන 56.61 ක් වියදම් දරා ඇති බව නිරීක්ෂණය විය.

(iii) එමෙන්ම දරන ලද වියදම තුළ වත්තල අධිකරණය ඉදිකිරීම - II අදියරට අදාළව රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට ගෙවන ලද රු.මිලියන 36.60 ක වියදමක්ද ඇතුළත්ව තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය. තවද, වත්තල අධිකරණය ඉදිකිරීම - II අදියර සඳහා සමාලෝචිත වර්ෂයේදී අයවැය ඇස්තමේන්තු ප්‍රතිපාදනයන්ද වෙන්කර නොතිබුණි.

(iv) උපදේශන සේවා ගාස්තුව කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 04 ක් හෙවත් රු.මිලියන 5.18 ක් ලෙස ස්ථාවර තාක්ෂණ ඇගයීම් කමිටුව අනුමත කර තිබුණි. එසේ වුවද, 2014 වර්ෂය තුළ පමණක් රු.මිලියන 7.26 ක මුදලක් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත ගෙවා තිබුණි. එසේ වුවද, 2014 දෙසැම්බර් 31 දිනට මෙම ඉදිකිරීමේ භෞතික ප්‍රගතිය සියයට 70 ක් පමණක් විය.

(v) ඉදිකිරීම I වන පියවරේදී සිදුකළ ශක්‍යතා අධ්‍යනයේ දුර්වලතාවයන් හේතුවෙන් පියවර I දී සිදුකළ යුතු අවශ්‍යතා වන ජල පද්ධතිය හා ගිනි නිවීමේ ආරක්ෂක පද්ධතිය සැකසීම, විනිශ්චය ආසන දෙකක් සැකසීම, මහජන වැසිකිළි පද්ධතිය ඉදිකිරීම, විදුලි උත්පාදන යන්ත්‍ර සවි කිරීම, දොර ජනෙල් සවි කිරීම සහ මුර කුටිය ඉදිකිරීම, ඉදිකිරීම් පියවර II දී සිදු කිරීමට සැලසුම් කර තිබුණි. ඊට අදාළ ඇස්තමේන්තුව රු.මිලියන 148.29 ක් වී තිබුණි. 2016 නොවැම්බර් 29 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය ප්‍රකාරව මෙම ව්‍යාපෘතිය ද, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත 2016 දෙසැම්බර් 24 දින සිට ප්‍රදානය ලබා දී තිබුණි. කොන්ත්‍රාත් ගිවිසුම අනුව දින 240 ක් තුළ එනම්, 2017 අගෝස්තු 21 දින වැඩ අවසන් විය යුතු වුවද විගණන දිනය වූ 2017 නොවැම්බර් 30 දින වන විටත් වැඩ අවසන් වී නොතිබුණි.

(vi) ඉදිකිරීමේ I පියවර අදාළ ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් ගිවිසුමේ 8.7 ඡේදය ප්‍රකාරව ප්‍රමාද වන දිනක් සඳහා කොන්ත්‍රාත් මුදලින් සියයට 0.05 ක් ලෙස රු.12,269,270 ක ප්‍රමාද ගාස්තුවක් අවස්ථා 04 කදී අයකර තිබුණි. එහෙත් කොන්ත්‍රාත්කරුගේ පාලනයෙන් බැහැර නොවූ කරුණු වෙනුවෙන් නිසි අධීක්ෂණයක් නොකර දින දීර්ඝයන් ලබාදීම නිසා අයකළ ප්‍රමාද ගාස්තුව නැවත ආපසු ගෙවීමට සිදු වී තිබුණි. එම අවස්ථාවේදී සිදු වූ වැට් බදු සංශෝධන නිසා එම සංශෝධිත වැට් බද්ද ඇතුළුව රු.12,528,663 ක් ආපසු ගෙවීම නිසා රු.259,393 ක් වැඩිපුර ගෙවා තිබුණි.

**(ඊ) හෙල්බොඩ සංචාරක මහේස්ත්‍රාත් අධිකරණයේ සහ ගම්පොළ දිසා/ මහේස්ත්‍රාත් අධිකරණයේ මහජන වැසිකිළි ඉදිකිරීම සහ ගම්පොළ දිසා විනිසුරු නිළ නිවස සඳහා මුරකුටියක් ඉදිකිරීම.**

---

(i) ප්‍රධාන කොටස් තුනකින් සමන්විත උක්ත ඉදිකිරීම්වලට අදාලව අමාත්‍යාංශයේ ඇස්තමේන්තුව රු.2.718,740 ක්(VATරහිතව) වූ අතර ඒ සඳහා ආයතන 09 ක් වෙතින් සීමිත මිළ ගණන් කැඳවීම් සිදුකර තිබුණි. මිල ගණන් ඉදිරිපත් කළ එකම ආයතනය වූආයතනය වෙත රු.2,501,796 ( VAT රහිතව ) ක මුදලකට මෙම කොන්ත්‍රාත්තුව පැවරිමට අමාත්‍යාංශ සුළු ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබා දී තිබුණි. 2014 දෙසැම්බර් 12 සිට වැඩ ආරම්භ කර දින 105 ක් තුළදී වැඩ අවසන් කිරීම ඉලක්ක කර ගෙන කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණ අතර, වැඩ අවසන් කළ යුතු දිනය 2015 මාර්තු 27 දින විය.

එහෙත් කොන්ත්‍රාත්කරුගේ ඉල්ලීම සළකා බලා 2015 ඔක්තෝම්බර් 20 දක්වා අවස්ථා දෙකකදී දින දීර්ඝ කිරීම් ලබා දී තිබුණි. එසේ කොන්ත්‍රාත්කරුට දින දීර්ඝ කිරීම් ලබා දී තිබුණද වැඩ අවසන් නොකිරීම නිසා 2016 අප්‍රේල් 25 දින රැස්වූ සුළු පරිමාණ ප්‍රසම්පාදන කමිටුව කොන්ත්‍රාත්තුවේ කටයුතු නතර කිරීමට තීරණය කර තිබුණි. ඒ වන විට ව්‍යාපෘතියේ කළ වැඩහි වටිනාකම රු.1,184,749 ක් විය.

(ii) මුල් කොන්ත්‍රාත්තුව අවසන් කරන දිනය වන විට කොටස් තුනකින් සමන්විත මෙම ව්‍යාපෘතියේ ගම්පොළ දිසාවිනිසුරු නිළ නිවස සහ මුරකුටියක් ඉදිකිරීමේ කර්මාන්තය පමණක් නිම වී තිබුණ අතර, හෙල්බොඩ සංචාරක මහේස්ත්‍රාත් අධිකරණයේ මහජන වැසිකිළි ඉදිකිරීමේ කර්මාන්තයේ ඉතිරි වැඩ රු.603,563 ක් හෙවත් මුළු ඇස්තමේන්තුවෙන් සියයට 70 ක්ද, ගම්පොළ දිසා/ මහේස්ත්‍රාත් අධිකරණයේ මහජන වැසිකිළි ඉදිකිරීමේ කර්මාන්තයේ ඉතිරි වැඩ රු.534,097 ක් හෙවත් මුළු ඇස්තමේන්තුවෙන් සියයට 62 ක් ද විය.

(iii) මුල් ව්‍යාපාතියේ තව දුරටත් නිම නොකළ ඉතිරි කොටස වූ හෙල්බොඩ සංචාරක මහේස්ත්‍රාත් අධිකරණයේ මහජන වැසිකිළි ඉදිකිරීමේ කාර්යය සඳහා 2017 අගෝස්තු 21 දිනැති අංක 2441 දරන බලපත්‍රය මගින් KAN-1-1-7-2104 (Small Scale Development Programme) වැය විෂයය යටතේ රු.923,000 ක ප්‍රතිපාදන ලබා දී තිබුණද එහි ප්‍රගතිය සම්බන්ධයෙන් තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය. තවද 2016 අප්‍රේල් 25 දින වැඩ අවසන් කරන විට මෙම ව්‍යාපාතියේ ඉතිරි වැඩ වටිනාකම රු. 603,563 ක් වූ නමුත් 2017 නව ඇස්තමේන්තුව රු.923,000 ක් ප්‍රතිපාදන ලබා දී තිබුණි. ඒ අනුව කොන්ත්‍රාත්තුව ප්‍රමාද වීම නිසා රු. 319,437 ක් වැඩියෙන් ප්‍රතිපාදන ලබා දී තිබුණි.

(iv) තවද, රාජ්‍ය නිලධාරින් හා මහජනතාව නිතර ගැවසෙන ස්ථානයක් වන අධිකරණයන් තුළ වැසිකිළි පහසුකම ඉතා වැදගත් අවශ්‍යතාවක් වන අතර එකී අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම සඳහා මෙසේ වසර 03 කට ආසන්න කාලයක් ගතවීමෙන් ඉදිකිරිමෙන් බලාපොරොත්තු වූ අරමුණු ඉටු වී නොතිබුණි. 2016 අප්‍රේල් 25 දින වැඩ නතර කරන ලද මෙම ව්‍යාපෘතිය පිළිබඳව අදාළ නිලධාරින් විසින් ස්ථානීය පරීක්ෂාවක් සිදුකර තිබුණේ වසරක පමණ ප්‍රමාදයකින් පසුවය.

(උ) **ගලගෙදර මහේස්ත්‍රාත් අධිකරණය ඉදිකිරීම**

-----------------------------------------------

පවත්නා සංචාරක මහේස්ත්‍රාත් අධිකරණ ගොඩනැගිල්ල කඩා ඉවත් කර එම භූමියේ නව ගොඩනැගිල්ලක් ඉදිකිරීමට විවෘත මිල ගණන් කැඳවා දෙවන අවම මිල වූ රු.63,162,829 කට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව පවත්නා මහේස්ත්‍රාත් අධිකරණ ගොඩනැගිල්ල කඩා ඉවත් කර නව ගොඩනැගිල්ල ඉදිකිරීමට නිර්දේශ කර තිබුණද එය ඉවත් කිරීමට පෙර නව ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කරු තෝරාගෙන තිබුණි. 2014 දෙසැම්බර් 15 දින ගිවිසුම් අත්සන් කිරීමෙන් අනතුරුව වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස රු. 12,523,566 ක් (වැට් සහිත) 2014 දෙසැම්බර් 31 දින කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. නමුත් ඉදිකිරීම සඳහා වැඩබිම භාරදී තිබුණේ ඉන් මාස 6 ½ කට පසු එනම්, 2015 ජූලි 20 දිනය.

(ii) 2015 සැප්තැම්බර් 11 දිනෙන් අවසන් කළ යුතුව තිබූ මෙම ව්‍යාපෘතිය වර්ෂ 1 ½ ක කාල පමාවක් සහිතව 2017 මැයි 04 දින නිමකර භාර දී තිබූ අතර ශ්‍රී ලංකා ඉංජිනේරු සංස්ථාවට රු.3,383,794 ක් උපදේශන ගාස්තු ගෙවා තිබුණි. එසේ වුවද මහනුවර තාක්ෂණ නිලධාරීගේ 2017 මැයි 29 දිනැති ලිපිය මගින් ඉදිකිරීම සම්බන්ධයෙන් අඩුපාඩු රාශියක් පෙන්වා දී තිබුණි.

(iii) අමාත්‍යාංශයේ හා උපදේශන සේවා සැපයූ ආයතනයේ අඩුපාඩු ව්‍යාපෘතිය ප්‍රමාද වීමට බෙහෙවින් බලපා තිබුණු අතර, 08 වන බිල්පත ගෙවීමේදී ගිවිසුම් ප්‍රකාර අඩුකර තිබූ රු. 3,631,863 ක ප්‍රමාද ගාස්තු 2017 ජූනි 05 දින කොන්ත්‍රාත්කරුට නැවත ගෙවා තිබුණි.

(iv) කෙසේ වුවද ව්‍යාපෘතිය වසර 1 ½ ක් ප්‍රමාද වීම හා ඉදි කිරීම් වල අඩුපාඩු පැවතීම හේතුවෙන් නව අධිකරණයක් ඉදිකිරීමෙන් බලාපොරොත්තු වූ කාර්යසාධනයට ලඟා නොවීම හා එම හේතුවෙන් අධිකරණයෙන් සේවා ලබා ගන්නා පාර්ශවයන් වෙත සිදු වූ අපහසුතාවන් අවම කිරීමට අමාත්‍යාංශය විසින් ප්‍රමාණවත් පියවර ගෙන ඇති බව විගණනයේදී නිරීක්ෂණය නොවිය.

**(ඖ) ගාල්ල සිවිල් අභියාචන මහාධිකරණයේ පැතිබැම්ම ඉදිකිරීම**

ගාල්ල සිවිල් අභියාචන මහාධිකරණයේ පැති බැම්ම ඉදිකිරීමව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු රු.මිලියන 6.0 කට පිරිනමා තිබුණි. 2015 ජනවාරි 30 දින අමාත්‍යාංශ ලේකම් හා කොන්ත්‍රාත්කරු අතර එළඹී ගිවිසුම අනුව 2014 දෙසැම්බර් 24 දින සිට දින 210 කින් එනම් 2015 ජුලි 22 දින නිම විය යුතුව තිබුණි. භූමි යෝග්‍යතා සහතික ලබා ගැනීම ප්‍රමාද වීම ගාල්ල මහනගර සභාවේ අනුමැතියෙන් තොර ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම නිසා ඉදිකිරීම් නතර කරන ලෙස දැනුම් දීම යන කරුණු මත ව්‍යාපෘතිය අතරමඟ නතර කර තිබුණි. ඒ වෙනුවට අධිකරණ ආරක්ෂාවට කම්බි වැටක් ඉදිකිරීම හා ආරක්ෂිත කැමරා පද්ධතියක් සවි කිරීමට පියවර ගෙන තිබූ අතර මෙම උක්ත ව්‍යාපෘතිය වෙනුවෙන් ගෙවා තිබූ රු.2,722,838 ක මුදල අනාර්ථික ගණුදෙනුවක් ලෙස නිරීක්ෂණය විය.

**2.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.2 මාර්ගෝපදේශය අනුව රු. මිලියන 100 ක් නොඉක්මවන ප්‍රසම්පාදනයන් සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අනුමත කළයුතු වුවද ගම්පොළ දිසා/ මහේස්ත්‍රාත් අධිකරණයේ මහජන වැසිකිළි ඉදිකිරීමේ කර්මාන්තයේ ඉතිරි වැඩ සඳහා සකස් කළ රු.528,000 ක් වූ නව පිරිවැය ඇස්තමේන්තුව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අනුමත කර නොතිබුණි.

(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.4.1 මාර්ගෝපදේශය අනුව අවශ්‍ය විධිමත් අනුමැතීන් ලබාගැනීමට ප්‍රමාණවත් කාලයක් සැලසෙන පරිදි ලංසු ඇගයීම හැකිතාක් ඉක්මණින් කළයුතු වුවද ගලගෙදර මහේස්ත්‍රාත් අධිකරණය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවේ ලංසු විවෘත කිරීම 2014 අගෝස්තු 18 දින සිදුකර තිබූ අතර ලංසු ඇගයීම කර තාක්ෂණික ඇගයීම් වාර්ථාව ඉදිරිපත් කිරීමට මාස 03 ක පමණ කාලයක් ( 2014 නොවැම්බර් 11 ) ගතකර තිබුණි.

(ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 මාර්ගෝපදේශය අනුව ලංසු කරුවකු විසින් ඉදිරිපත් කරන ලද ලංසු ප්‍රතිග්‍රහණය කිරීමෙන් පසු අදාල ලංසු කරු වෙත වහාම විධිමත් ප්‍රතිග්‍රහණ ලිපියක් නිකුත් කළයුතු අතර, ඒ සමගම විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් ලියා අත්සන් කිරීම සිදු කළයුතු වුවද හෙල්බොඩ සංචාරක මහේස්ත්‍රාත් අධිකරණයේ සහ ගම්පොළ දිසා/ මහේස්ත්‍රාත් අධිකරණයේ මහජන වැසිකිළි ඉදි කිරීම සහ ගම්පොළ දිසා විනිසුරු නිල නිවස සඳහා මුරකුටියක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවට අදාල ප්‍රතිග්‍රහණ ලිපිය 2014 දෙසැම්බර් 05 දින ලංසුකරු වෙත යවා තිබුණද ගිවිසුමට එළඹ තිබුණේ 2015 ජනවාරි 30 දින දීය.

(ඈ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.3 වගන්තිය ප්‍රකාරව උපදේශන සේවාව (Consultancy Service) සැපයීම වෙනුවෙන් උපදේශන සේවා ආයතනය සමඟ ගිවිසුමකට එළඹිය යුතු වුවද වත්තල අධිකරණ සංකීර්ණය ඉදිකිරීම් ව්‍යාපෘතියේ උපදේශන සේවාව සැපයීම වෙනුවෙන් උපදේශන සේවා ආයතන හා අධිකරණ අමාත්‍යාංශය අතර ලිඛිත ගිවිසුමකට එළඹ නොතිබුණි.

(ඉ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.3 (ආ) වගන්තිය අනුව ශ්‍රී ලංකා රු.500,000 ක් ඉක්ම වන භාණ්ඩ හෝ සේවා සඳහා විධිමත් කොන්ත්‍රාත්තුවකට අදාල අධිකාරීන් විසින් අත්සන් කළයුතු වුවද විවෘත අධිකරණවල නීතීඥවරුන්ගේ ප්‍රයෝජනය සඳහා පුටු 800 ක් මිලදී ගැනීම් සඳහා වූ රු.3,940,176 ක( Vat රහිත) කොන්ත්‍රාත්තුව සඳහා විධිමත් ගිවිසුමකට එළඹ නොතිබුණි.

(ඊ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.2 වගන්තිය අනුව පිරිවිතර හා එකඟ වී ඇති වෙනත් නියම හා කොන්දේසි වලට අනුකූලව වැඩ ඉටුකර ඇති බව සහ සහතික කර ඇති ගෙවීම් කොන්ත්‍රාත්තුවේ කොන්දේසි වලට අනුකූල බව සහතික කරමින් වැඩ අවසන් කිරීම් සහතිකයක් ඉංජිනේරුවරයා/ උපදේශකවරයා විසින් නිකුත් කළයුතු වුවද කළවංචිකුඩි අධිකරණයේ නව ලේඛණාගාරය සහ නඩු භාණ්ඩ කාමර ගොඩනැගිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතියේ වැඩ අවසන් කළ බවට සහතිකයක් නිකුත් කර නොතිබුණු අතර ගම්පොළ දිසා/ මහේස්ත්‍රාත් අධිකරණයේ මහජන වැසිකිළි ඉදිකිරීමේ දෙවන කොන්ත්‍රාත්තුවේ වැඩ අවසන් කළ බවට සහතිකයක් නිකුත් කොට නොතිබුණි.

(උ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.13.4 වගන්තිය අනුව ඉදිරිපත් කරන මිල ගණන් වල සියයට 05 ක මිල විචලන හා සියයට 10 ක අවිනිශ්චිත වියදම් සඳහා ප්‍රතිපාදන සැලසිය යුතු අතර ගලගෙදර මහේස්ත්‍රාත් අධිකරණය ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවේ තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාවේ සියළුම මිල ගණන් අවිනිශ්චිත වියදම් සහිතව සහ බදු රහිතව ඉදිරිපත් කර ඇතිබව දක්වා තිබුණද විගණනයේදී නිරීක්ෂණය වූයේ මෙම මිල බදු රහිත මෙන්ම අවිනිශ්චිත වියදම් රහිත මිලක් බවයි. ඒ අනුව අදාළ ප්‍රදානය ලබාදුන් මිල වූ රු.63,162,829 ම අවිනිශ්චිත වියදම් සහිත මිලක් සේ තීරණය කර තිබූ තාක්ෂණික ඇගයීම් කමිටු හා ප්‍රසම්පාදන කමිටු තීරණ නිවැරදි නොවන බව නිරීක්ෂණය විය.

(ඌ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.14.1 වගන්තිය ප්‍රකාරව ප්‍රමාදයන් සිදුවූයේ කොන්ත්‍රාත්කරුගේ පාලනයෙන් බැහැර වූ අවස්ථානුගත හේතූන් බවට ප්‍රසම්පාදන අස්ථිත්වය සෑහීමකට පත්වන පරිදි තහවුරු කරනු ලබන විට විශේෂ අවස්ථානුගත හේතූන් වලදී හෝ ස්වාභාවික ව්‍යවසනයකදී අධිකාරිය ලත් පුද්ගලයෙකු විසින් කාලය දීර්ඝ කිරීම ප්‍රදානය කළ හැකිය. එසේ වූවද, වත්තල අධිකරණ සංකීර්ණය ඉදිකිරීම, කලවංචිකුඩි අධිකරණයේ නව ලේඛනාගාරය සහ නඩු භාණ්ඩ කාමර ගොඩනැගිල්ල ඉදිකිරීම , හෙල්බොඩ සංචාරක මහේස්ත්‍රාත් අධිකරණයේ සහ ගම්පොළ දිසා විනිසුරු නිල නිවස සඳහා මුර කුටියක් ඉදිකිරීමේ කොන්ත්‍රාත් වලදී ඒ අනුව කටයුතු කර නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 2.3 වත්කම් කළමනාකරණය

---------------------------

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) අධිකරණ කළාප 33 කට අයත් අධිකරණ 221 ක් පිළිබඳව ඉදිරිපත් කර ඇති තොරතුරු අනුව ඉඩමේ අයිතිය සඳහන් කර තිබූ අධිකරණ සංඛ්‍යාව 132 ක් පමණක් විය.

(ආ) ඉඩමේ නම සඳහන් කිරීමට නොහැකි අධිකරණ සංඛ්‍යාව 162 ක් වූ අතර, ඉඩමේ ප්‍රමාණය සඳහන් අධිකරණ සංඛ්‍යාව 147 ක් පමණකි. අධිකරණ 19 ක් සඳහා පමණක් ඉඩම් සම්බන්ධයෙන් පැවරුම් සහතික ලබාගෙන ඇති අතර අධිකරණ 24 ක පමණක් ඉඩම්වල තක්සේරු වටිනාකම ගණනය කර ඇත. ඒ අනුව ඉඩම් පිළිබඳ නිවැරදි වටිනාකම ගිණුම්ගත කිරීමට අමාත්‍යාංශය මෙතෙක් කටයුතු කර නොතිබුණි.

(ඇ) 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2017 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ සිදු කර එම වාර්තා චක්‍රලේඛයේ 3.2.6 ඡේදය ප්‍රකාරව 2018 ජූනි 15 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද 2018 සැප්තැම්බර් 18 දින වන විටත් භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ඈ) මාතර නගර සංවර්ධන සැලැස්ම යටතේ නව රෝහල් සංකීර්ණය සඳහා අත්පත් කරගත් ඉතිරි කොටස් සංවර්ධන ව්‍යාපෘති සඳහා පවරා දීමට ගත් තීරණය පරිදි අධිකරණ අමාත්‍යාංශයට හෙක්ටෙයාර් 4.263 ක බිම් ප්‍රමාණයක් මාතර අධිකරණ සංකීර්ණය ඉදිකිරීම සඳහා වෙන් කර අමාත්‍යාංශය විසින් එහි භුක්තිය පමණක් භාර ගෙන ඇතත් මෙම ඉඩම අමාත්‍යාංශය වෙත විධිමත්ව පවරා නොතිබුණි.

## 2.4 පාඩු හා හානි

---------------

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණය පහත දැක්වේ.

නොච්චියාගම සංචාරක මහේස්ත්‍රාත් අධිකරණය ඉදිකිරීම කොන්ත්‍රාත්තුව අතහැර ගියා සේ සලකා 2013 නොවැම්බර් 20 දින කොන්ත්‍රාත්කරු දැනුවත් කර තිබුණි. කොන්ත්‍රාත්තුව සඳහා ලබාගෙන තිබූ රු.1,503,056 ක කාර්යසාධන ඇපකර මුදල අය කර ගැනීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි.එසේම වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස ලබාදී තිබූ රු.2,114,829 ක අත්තිකාරම් මුදල අය කර ගැනීමටද කටයුතු කර නොතිබුණි.

## 2.5 කළමනාකරණ දුර්වලතා

-------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) අත්‍යාවශ්‍ය කටයුතු සඳහා ඇස්තමේන්තු සකස් කර ලබාගත් ප්‍රතිපාදන අදාල කාර්ය සඳහා යෙදවිය යුතු වුවද,මාරවිල දිසා/ මහේස්ත්‍රාත් අධිකරණයේ අත්‍යාවශ්‍ය අළුත්වැඩියා කටයුතු සඳහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුව මගින් රු.5,134,000 ක ඇස්තමේන්තුවක් සකස් කළ තිබියදී MJ/ENG/ALLO/Chilow/ 2016 හා අගෝස්තු 30 දිනැති අධිකරණ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්ගේ ලිපිය මගින් ඇස්තමේන්තුවේ අයිතම අංක 01 හා 02 සඳහා පමණක් රු.80,000 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් රඳවා ගැනීමට අනුමත කර ඉතිරිය රු.5,054,000 ක ප්‍රතිපාදන නැවත ආපසු පවරාගෙන තිබුණි.

(ආ) මාතර අධිකරණ සංකීර්ණය ඉදිකිරීම සඳහා රු. මිලියන 1,119.5 ක් ඇස්තමේන්තු කර තිබුණි. 2016 මාර්තු 09 දින ලැබී තිබූ අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත 2016 මැයි මස සිට 2019 මැයි අවසන් කළයුතු මෙහි ඉදිකිරීම් කටයුතු සඳහා මධ්‍යම උපදේශක කාර්යාංශයේ සෙන්ට්‍රල් ඉංජිනියරින් සර්විසස් පුද්ගලික සමාගම වෙත පවරා තිබුණු අතර රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 8.9.1 (ආ) මාර්ගෝපදේශය ප්‍රකාරව විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් ලියා අත්සන් කළයුතු වුවද විධිමත් ගිවිසුමකින් තොරව වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස 2016 වර්ෂයේ අවස්ථා 02 කදී රු.154,926,000 ( වැට් සහිතව ) කාර්යංශය වෙත ගෙවා තිබුණි.

(ඇ) මාතර අධිකරණ සංකීර්ණය ඉදිකිරීම සඳහා වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස රු.184,926,000 ක් ද කළ වැඩ සඳහා බිල්පත් 09 ක් වෙනුවෙන් රු.234,094,271 ක් ද වශයෙන් රු. 419,023,270ක් ( වැට් සහිත ) මුළු පිරිවැය ඇස්තමේන්තු පිරිවැයෙන් සියයට 38 ක්, උපදේශන ආයතන හා කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණ නමුත් 2017 ඔක්තෝබර් මස දක්වා අමාත්‍ය මණ්ඩල අනුමැතිය පිරිදි ඇස්තමේන්තුව සඳහා නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ ස්ථාවර තාක්ෂණ කමිටුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ඇ) පානදුර මහේස්ත්‍රාත් අධිකරණයට අයත් සමාලෝචිත වර්ෂය අවසන් වන විට මාස 06 ක කල් ඉකුත් වූ රු.4,259,627 ක් වටිනා චෙක්පත් 51 ක් පැවතුණි. ඒ සම්බන්ධයෙන් සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී 2016 වර්ෂයේ දී රාජ්‍ය ආයතන 02 ක නම සඳහන් කරන ලද එකතුව රු.3,630,076 ක් වූ චෙක්පත් 02 ක් හා 2017 මාර්තු 30 දින රාජ්‍ය ආයතනයක නම සඳහන් කරන ලද රු.185,000 ක චෙක්පතක් 2018 ජූනි 20 දින වන විටත් අදාළ ගෙවීම් ලාභීන් වෙත භාර නොදී අත රඳවාගෙන තිබුණි. ඉන් රු.1,850,000 ක් වූ චෙක්පත සඳහා චෙක්පත් අත්සන් කිරීමට බලය ලබා නොදුන් නිලධාරීන් විසින් අත්සන් කර තිබුණු බවත් නිරීක්ෂණය විය.

## 2.6 කාර්යභාරයන් ඉටු කිරිම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරිම

---

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය හා ඉකුත් වර්ෂය තුළ දෙපාර්තමේන්තුවට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2013 | පුනරාවර්තන | 3,775.17 | 3,761.32 | 13.85 | 0.37 |
| | මූලධන | 1,020.74 | 910.57 | 110.17 | 10.79 |
| | **එකතුව** | 4,795.91 | 4,671.89 | 124.02 | 2.59 |
| 2014 | පුනරාවර්තන | 4,075.55 | 4,053.69 | 21.86 | 0.54 |
| | මූලධන | 1,026.90 | 877.42 | 149.48 | 14.56 |
| | **එකතුව** | 5,102.45 | 4,931.11 | 171.34 | 3.36 |
| 2015 | පුනරාවර්තන | 5,061.93 | 4,992.98 | 68.95 | 1.36 |
| | මූලධන | 1,205.09 | 824.06 | 381.03 | 31.62 |
| | **එකතුව** | 6,267.02 | 5,817.04 | 449.98 | 7.18 |
| 2016 | පුනරාවර්තන | 5,488.03 | 5,352.67 | 135.36 | 2.47 |
| | මූලධන | 1,454.65 | 1,223.18 | 231.47 | 15.91 |
| | **එකතුව** | **6,942.68** | **6,575.85** | **366.83** | **5.28** |
| 2017 | පුනරාවර්තන | 5,632.26 | 5,618.86 | 13.40 | 0.24 |
| | මූලධන | 2,549.55 | 1,761.99 | 787.55 | 30.89 |
| | **එකතුව** | **8,181.81** | **7,380.86** | **800.95** | **9.79** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 03ක් සඳහා සලසා තිබුණු රු.මිලියන 10.75 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් කිසිදු උපයෝජනයක් නොකර මුළුමණින්ම ඉතිරි කර තිබුණි.

(ආ) මූලධන වැය විෂයයන් 10 සහ පුනරාවර්තන වැය විෂයන් 03 ක් සඳහා එකතුව රු.මිලියන 608.27 ක අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම වැය විෂයයන්ට අදාළ ප්‍රතිපාදනවලින් එකතුව රු.මිලියන 532.88 පමණක් උපයෝජනය කිරීම නිසා ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 16 ක සිට සියයට 97 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

(ඇ) වාර්ෂිකව පුනරාවර්තනය වන සේවාවන් හෝ සැපයුම් යටතට අයත් නොවන පුනරාවර්තන වැයවිෂයයන් 07 ක රු.18,413,050 ක් හා මූලධන වැය විෂයයන් 02 ක රු.1,221,258 ක් ප්‍රතිපාදන ඉක්මවා බැරකම් වලට බැඳී තිබුණි.

## 2.7 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

අධිකරණ පරිපාලන දෙපාර්තමේන්තුවට අදාල විෂය අංක 22801 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 475.00 | 469.35 | 280.00 | 309.82 | 1,400.00 | 1,140.55 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.22,668,534 ක්වූ අතර, ඉන් රු.6,166,219 ක් 2018.09.30 දිනට අය කරගෙන තිබුණි. ඒ අනුව තව දුරටත් අය වියයුතු රු.16,502,315 ක ණය ශේෂයක් පවතින අතර එම ණය ශේෂය මාස 03 සිට වර්ෂ 05 දක්වා කාල පරාසයක සිට පැවත එන ණය ශේෂ බව නිරීක්ෂණය විය.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව හා දෙපාර්තමේන්තු පාලන ගිණුමේ ශේෂය නොසැසඳුනු අතර රු.13,313,341 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) මහනුවර අධිකරණ කළාපයට අයත් ස්ථාන මාරු වී පැමිණි නිලධාරියෙකු වෙනුවෙන් වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවලට නිරවුල් කළයුතු රු.22,380 ක ණය ශේෂය වසර පහකට වැඩි කාලයක් ගත වී තිබුණද නිරවුල් කර නොතිබුණි.

## 2.8 පොදු තැන්පත් ගිණුම

-----------------------

දෙපාර්තමේන්තුව යටතේ වන පොදු තැන්පත් ගිණුම් 05ක 2017 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.මිලියන 9353.97ක් විය. රු.9,353,974,740 ක් වූ අධිකරණ කළාපයන්හි මුළු තැන්පත් පිළිබඳව කාල විශ්ලේෂණයක් ඉදිරිපත් කර නොතිබූ අතර. අධිකරණ පරිපාලනයට අදාලව අමාත්‍යාංශයේ පවතින තැන්පත් ගිණුම් සඳහා පමණක් කාල විශ්ලේෂණයක් ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව වසර දෙකකට වැඩි රු.17,044,659 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 2.9 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

---------------------------------------------

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලංසු කැඳවීමේ ලේඛනය පවත්වා නොතිබුණු අතර, අනෙක් ලේඛන දෙක විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|---|
| (අ) | ලංසු කැඳවීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.2.1 මාර්ගෝපදේශය |
| (ආ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ඇ) | පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳව ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි /2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |

## 2.10 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

--------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| **(අ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| | (i) මුදල් රෙගුලාසි 109 (1) හා (2) | 1,177,237 | වාහන අනතුරු 44 කට අදාලව වූ අලාභ සම්බන්ධයෙන් වසර 01 සිට 09 දක්වා කාලයක් ගත වී තිබුණත් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| | (ii) මුදල් රෙගුලාසි 396 (ඇ) | 5,977,262 | සමාලෝචිත වර්ෂය අවසානයට මහාධිකරණ කළාප 19 කට අයත් බැංකු ගිණුම් 62 ක බැංකුවට ඉදිරිපත් නොකරන ලද මාස 06 ඉක්ම වූ රු.5,977,262 ක් වූ චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ආ) | 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් ගිවිසුම පනතේ 08 වන වගන්තිය | | ඉදිකිරීම් කොන්ත්‍රාත් 06 කට අදාලව කොන්ත්‍රාත්කරුවන් හා කොන්ත්‍රාත් ගිවිසුම් ලියාපදිංචි කර නොතිබුණි. |
| (ඇ) | 1978 අංක 41 දරන නාගරික සංවර්ධන පනත 08 ඒ වගන්තිය | - | ගලගෙදර මහේස්ත්‍රාත් අධිකරණය ඉදිකිරීමේ ව්‍යාපෘතියේ කටයුතු 2017 මැයි 04 දින අවසන් වී ඇතත් විගණන දිනය වූ 2017 ඔක්තෝබර් 30 දක්වාම සංවර්ධන බලපත්‍රය ලබාගෙන නොතිබුණු අතර මාතර අධිකරණ සංකීර්ණය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා ද සංවර්ධන බලපත්‍රයක් ලබාගෙන නොතිබුණි. |

## 2.11 විගණන හා කළමනාකරණ කමිටුව

සමාලෝචිත වර්ෂය සඳහා අධිකරණ අමාත්‍යාංශය යටතේ විගණන හා කළමනාකරණ කමිටුව ස්ථාපිත කර තිබූ අතර 2016 ජනවාරි 28 දිනැති අංක DMA / 2009 (1) (i) දරන කළමණාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව කාර්තුවකට එක බැගින් රැස්වීම් වාර 04 ක් පැවැත්විය යුතු වුවත්, රැස්වීම් වාර 02 ක් පමණක් පවත්වා තිබුණි.

## 2.12 මානව සම්පත් කළමනාකරණය

### 2.12.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම

2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු.මිලියන 4,485ක් වැය කර තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 386 | 468 | - | 82 |
| (ii) | තෘතියික මට්ටම | 445 | 234 | 211 | - |
| (iii) | ද්විතියික මට්ටම | 4,958 | 4,618 | 340 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 4,319 | 3,751 | 568 | - |
| | **එකතුව** | **10,108** | **9,071** | **1,119** | **82** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයේ පිරවීමට සේවක පුරප්පාඩු 1119 ක් තිබුණද, අනුමත කාර්ය මණ්ඩලය පදනම් කරගෙන ඇස්තමේන්තු සකස් කර ලබා ගන්නා වැටුප් හා වේතන, අතිකාල හා නිවාඩු දින වැටුප්, කාර්ය මණ්ඩල පුහුණු වීම් වැනි වැය විෂයන්වල ප්‍රතිපාදනයන්ගෙන් සියයට 95 කට වැඩි ප්‍රතිපාදනයන් වැය කර තිබූ බව නිරීක්ෂණය විය.

(ආ) බඳවා ගෙන තිබුණු අතිරික්ත සේවක සංඛ්‍යාව 82 ක් පිළිබඳව විධිමත් අනුමැතියක් ලබා ගැනීමට අධිකරණ පරිපාලනය අපොහොසත් වී තිබුණි.